# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2304/34 - 2022 නොවැම්බර් මස 01 වැනි අඟහරුවාදා - 2022.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක : 87

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත (සංශෝධිත)**

10(1) (ආ) (ii) වගන්තිය යටතේ විධානය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(ආ)(ii) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින් මෙහි පහත උපලේඛනයේ සඳහන් කලින් ඇසුරුම් කළ භාණ්ඩ, අයිතමයන් හා නිෂ්පාදන සම්බන්ධ සියලුම ආනයනකරුවන් විසින් එම භාණ්ඩ නිෂ්පාදන දිවයිනට ඇතුළුවන ස්ථානයේදී එම භාණ්ඩය මත එම භාණ්ඩයට අදාළ ආනයනකරු විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද ප්‍රකාශිත ''උපරිම සිල්ලර මිල'' (Maximum Retail Price), ආනයනකරුගේ නම සහ ලියාපදිංචි ලිපිනය ඉංග්‍රීසි භාෂාවෙන් පැහැදිලිව සඳහන් කර තිබිය යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය පහත දැක්වෙන භාණ්ඩ හා නිෂ්පාදනවලට අදාළ වේ.

- රස කැවිලි (චුයින්ගම් ඇතුළුව) — සංයෝජිත වර්ගීකරණය අංකය (HS code) 1704
- චොකලට් — සංයෝජිත වර්ගීකරණය අංකය (HS code) 1806
- බිස්කට් — සංයෝජිත වර්ගීකරණය අංකය (HS code) 1905
- කේක් — සංයෝජිත වර්ගීකරණය අංකය (HS code) 1905
- සුවඳ සබන් — සංයෝජිත වර්ගීකරණය අංකය (HS code) 3401

මෙම විධානය 2022 නොවැම්බර් මස 01 වැනි දින සිට බලපැවැත්වේ.

තවද, 2007 ජූලි මස 11 වැනි දින අංක 1505/15 දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද විධාන අංක 12 මෙයින් අවලංගු කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

ශාන්ත නිරිඇල්ල,
සභාපති.

2022 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

EOG 11 - 0014

1A - PG 6025— 81 (2022/11)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*